www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නර්තනය	- (දේශීය)	II
நடனம்	- (தேசிய)	II
Dancing	- (Indigenous)	II

52 S II

පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours	අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(අ) තකු ජිං ජිං තක ජිංතක ජිං කුඳ

(ආ) දොම් තත් දිතගත ගදිතකු දොම් ගත

(ඉ) ජිං ජිං තක් කරතක තත් කිට ජිම් තක

(ii) පහත සඳහන් කවි පද සුළු මහ දෙතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"කොසඹෝ දිය නාපු-වයි වයි ගොඩ පැනපු"

(iii) ගජගා වන්නමේ අඩව්ව හෝ කොණ්ඩනාච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

2. දේශීය නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යයනයේ දී ලිඛිත හා පුරාවිද්‍යා මූලාශ්‍රය වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ පුරාවිද්‍යා මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ii) පොලොන්නරු යුගයේ නර්තන කලාව කෙරෙහි භාරතීය ආභාසය ලැබී ඇති බව සාධක **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) දේශීය නර්තන කලාව ප්‍රවර්ධනය වූ අවධියක් ලෙස 1930 හා 1940 දශක දෙක දැක්විය හැකි ය. සාධක **හතරක්** ඇසුරින් විමසන්න.

II කොටස

3. දේශීය ශාන්තිකර්ම විවිධ ඇදහිලි විශ්වාස මෙන්ම චාරිත්‍රවිධිවලින් සමන්විත වේ.

(i) කිරිමඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) සමාජ යහපැවැත්ම උදෙසා සන්නියකුම ශාන්තිකර්මයේ කථා පුවත් මගින් පිළිබිඹු වන සමාජ සාරධර්ම පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ ආගමික පසුබිම හා සමාජීය විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Alevel Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. දේශීය ශාන්තිකර්මයන්හි ගායන විධි, රංග භාණ්ඩ, වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රමවල විශේෂතා දක්නට ලැබේ.

(i) බලි ශාන්තිකර්ම ගායනා වර්ග **දෙකක්** පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) රටයකුම ශාන්තිකර්මයට අයත් නානුමුරය පෙළපාලි අංගයේ දක්නට ලැබෙන විශේෂතා, රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ ඇසුරින් විමසන්න.

(iii) සන්නියකුම ශාන්තිකර්මයේ රංග වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

5. ගැමි නැටුම් හා ගැමි නාටක මගින් තත්කාලීන ජන සමාජයේ ජීවන රටාව විවරණය කරයි.

(i) තුණුරුවන් සහ දෙවියන් පෙරදැරි කරගෙන ගැමි ගායනා නිර්මාණය වී ඇති බව ගැමි නැටුම් **දෙකකට** අයත් ගායනා ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ii) සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතිකාංගවල සමානතා ඇති බව ජන නැටුම් **දෙකක්** ඇසුරින් විමසන්න.

(iii) කෝලම් නාටකය මගින් සමාජ දුශ්චරිත උපහාසයට ලක් කරයි. ජස හා මුදලි කෝලම් චරිත ඇසුරින් විචාරය කරන්න.

III කොටස

6. පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) කොටස	**(ආ) කොටස**	**(ඉ) කොටස**
මෘදංගය	කල්පනා	මාරියස් පෙටිපා
කෝල් බෙරය	බැරිසිල්	චෛයිකොව්ස්කි
තබ්ලාව	ශාකුන්තලය	නිජින්ස්කි වස්ලව්
චෙන්ඩාව	පටාචාරා	II වන හෙන්රි රජු

(i) **(අ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි චරිත නිරූපණය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තරයක් කරන්න.

(iii) **(ඉ)** කොටස - නට් ක්‍රැකර් බැලේ නාට්‍යයේ රංග රචනය කළ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳව ඇගයීමක් කරන්න.

7. සාම්ප්‍රදායික රඟමඬලේ සහ නූතන වේදිකාවේ විවිධ වෙනස්කම් දැකිය හැකි ය.

(i) 'රංග භූමිය' නිර්වචනය කරන්න.

(ii) නූතන වේදිකාවක දැකිය හැකි නව ප්‍රවණතා **තුනක්** විස්තර කරන්න.

(iii) ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝකකරණය සහ නූතන වේදිකා ආලෝකකරණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

8. රූපවාහිනිය මගින් විකාශය වන නර්තන වැඩසටහන්වලින් නිර්මාණකරණයට හා විචාරයට අවස්ථාව සැලසේ.

(i) රූපවාහිනිය මගින් විකාශය වන නර්තන වැඩසටහන් **තුනක්** පිළිබඳව විස්තර කරන්න.

(ii) රියැලිටි නර්තන නිර්මාණ සඳහා විදේශීය ආභාසය ලැබී ඇති ආකාරය රංගවින්‍යාසය හා රංග වස්ත්‍රාභරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(iii) "සාම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය සඳහා රූපවාහිනී මාධ්‍යය ඉවහල් වී ඇත." විචාරයට ලක් කරන්න.

* * *

A/L උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.